**ආයුර්වේද වෛද්‍ය සභාව - 2020**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි, වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, ඉකුත් වර්ෂයන්හීදී එසේ සිදුකර නොතිබීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට පෙර වර්ෂ ගැලපුම් ගිණුමක් පැවති අතර එම ගිණුමේ එදිනට හර ශේෂය වූ රු.131,462 ක් ශුද්ධ වත්කම්වලින් අඩුකර දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී නිවරදි කරන බව. | මෙවැනි වැරදි ඇති නොවන ලෙස 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිලධාරියෙකුගේ සේවාකාලය වැඩියෙන් ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ පාරිතෝෂික දීමනා වෙන්කිරීම රු.151,240 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී නිවරදි කරන බව. | මෙම වරද නිවැරදි කර 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 111 වන කොටස | | | |
| (i) 11(1)(ඉ) වගන්තිය. | ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ඔවුන් අතරින් තෝරාපත් කරගනු ලැබූ සාමාජිකයන් තිදෙනෙකු සභාවේ සාමාජිකයන් ලෙස පත්කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම සාමාජිකයන් තිදෙනා පත්කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම සාමාජිකයින් තිදෙනා පත්කිරීම සඳහා ආයුර්වේද කොමසාරිස් විසින් ඡන්ද විමසීමක් පැවැත්විය යුතු නමුත් ඒ සඳහා අධික වියදමක් දැරිය යුතු බැවින් පළාත් කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ඡන්දය පැවැත්වීමට යෝජනා කර ගැසට් නිවේදනය සංශෝධනය සඳහා රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව. | ආයුර්වේද පනතට අනුව කටයුතු කළ යුතුය. |
| (ii) 18(ඇ) හා (ඈ) වගන්ති | 2020 දෙසැම්බර් 31 දිනට සභාවේ ලියාපදිංචිවී තිබුණු මුළු හෙද නිලධාරීන් සංඛ්‍යාව 39 ක් හා හෙසජ්ජකවරුන් සංඛ්‍යාව 260 ක් වූ අතර ලියාපදිංචිය කාලානුරූපව අලුත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු බැවින් එම සංඛ්‍යා යාවත්කාලීනවී නොතිබුණි. | ලියාපදිංචි හෙද නිලධාරීන් හා භෛෂජ්‍යයක වරුන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව හා පළාත් කොමසාරිස්වරුන් වෙතින් තොරතුරු කැඳවා ඇති බව හා ඉදිරියේදී එම ලේඛන වාර්ෂිකව යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | (iii) 19(i)(අ) වගන්තිය | සභාවේ ලේකම් වශයෙන් කටයුතු කරන ලේඛකාධිකාරීවරයෙකු පත්කළ යුතු වුවද, එම තනතුරට සුදුසු බඳවාගැනීමේ පටිපාටියක් පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර ස්ථිර පදනමින් ලේඛකාධිකාරිවරයකු බඳවා ගැනීමට කටයුතු නොකර එම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමට සහ වැඩ බැලීමේ පදනමට දිගින් දිගටම බඳවාගැනීම් සිදුකර තිබුණි. | 2021 අප්‍රේල් 05 දින සිට පූර්ණ කාලීන සේවයට ලේඛකාධිකාරීවරයෙකු සභාවේ අනුමැතිය මත පත් කර ඇති බව. | ආයුර්වේද පනතට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2005 ජූලි 05 දිනැති අංක 14/13/08 (03) දරන ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකාව | සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් වර්ෂ 05 කට වරක් ලියාපදිංචිය යාවත්කාලීන කළ යුතු නමුත් ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා සභාව විසින් විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලියාපදිංචිය වර්ෂ 05 ක් ඉක්ම වූ වෛද්‍යවරු 15,986 ක් සිය ලියාපදිංචිය අලුත් කරගෙන නොතිබුණි. | සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් සෑම වර්ෂ 05 කට වරක් යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් පළාත් කොමසාරිස්වරුන් මඟින් දැනුවත් කර ඇති බව හා ලියාපදිංචිය අලුත් නොකළ වෛද්‍යවරුන්ගේ නාමලේඛන දිස්ත්‍රික් මට්ටමින් සකස් කර පළාත් කොමසාරිස්වරුන් මඟින් ලියාපදිංචිය අළුත් කිරීම සඳහා යොමු කිරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කර ඇති බව. | වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය යාවත්කාලීන කිරීමට විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය | යම් කිසි වර්ෂයක වාර්ෂික වාර්තාව ඊළඟ වර්ෂයේ මැයි 31 දිනට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු නමුත් 2018 හා 2019 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා 2021 මාර්තු 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2018 හා 2019 වර්ෂයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා 2021 පෙබරවාරි 23 දින දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය වෙත භාරදී ඇති බව. | අදාළ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික වාර්තා කාලීනව සභාගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.28,349 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.272,468 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.300,817 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයේ ආදායමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම සියයට 20 කින් අඩුවී තිබුණද, සමාලෝචිත වර්ෂයේ වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 22 කින් අඩුවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) ඉකුත් වර්ෂයේ සභාවේ ප්‍රධාන ආදායම වූ ලියාපදිංචි කිරීමේ ගාස්තු ආදායම රු.8,420,360 ක් වුවද, සමාලෝචිත වර්ෂයේදී එම ආදායම රු.5,507,660 ක් දක්වා රු.2,912,700 කින් හෙවත් සියයට 34.59 කින් පහත බැස තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ සභාවේ මුළු වියදම රු.15,548,483 ක්වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.12,155,128 ක් දක්වා රු.3,393,355 කින් හෙවත් සියයට 21.82 කින් පහත බැස තිබුණි. කොවිඩ් වසංගත තත්ත්වයේ බලපෑම මත ආයතනයේ ක්‍රියාකාරීත්වය අඩුවීමෙන් ආයතන හා පරිපාලන වියදම් සහ විවිධ වියදම් අඩුවීම ඊට හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ වෘත්තීය විෂමාචාර සම්බන්ධයෙන්ද, ලියාපදිංචි නොවූ ආයුර්වේද වෛද්‍යවරුන් ලෙස පෙනී සිටින තැනැත්තන් සම්බන්ධයෙන්ද ඉකුත් වර්ෂ 4 තුළදී ලැබී තිබුණු පැමිණිලි 120 කින් හා සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු පැමිණිලි 100 කින් පිළිවෙලින් පැමිණිලි 52 ක හා පැමිණිලි 72 ක විමර්ශන කටයුතු 2021 මාර්තු 15 දින වන විටත් අවසන් කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේදී පරීක්ෂා කර තිබුණු පැමිණිලි 28 කින් වැඩිදුර පරීක්ෂාව සඳහා පොලිසිය වෙත යොමුකර තිබුණු පැමිණිලි 11 ක් සම්බන්ධයෙන් ප්‍රමාණවත් පසු විපරම් සිදුකර නොතිබුණි. තවද "ලියාපදිංචිය නොලබා වෛද්‍යවරයෙකු ලෙස පෙනී සිටිමින් ප්‍රතිකාර කරන ව්‍යාජ වෛද්‍යවරයෙකුට" එරෙහි පැමිණිල්ලක් අදාළ පොලිස් ස්ථානය වෙත යොමු කර නොතිබුණි. | 2020 වර්ෂයේ ඉදිරිපත් කර ඇති පැමිණිලි 100 ක මූලික අදියර අවසන් කර ඇති අතර එම පරීක්ෂණ සඳහා පැමිණිලිකරුවන්, සාක්ෂිකරුවන්, විත්තිකරුවන් කැඳවීම් කළ යුතු වුවද කෝවිඩ් වසංගතය හේතුවෙන් එය සිදු කිරීම අපහසුවූ බව, පොලිස්ථාන වෙත යොමු කර ඇති සෑම පැමිණිල්ලක් සම්බන්ධයෙන් එහි ප්‍රගතිය පසුවිපරම් කරමින් විමර්ශන කටයුතු කඩිනම් කිරීමට කටයුතු කර ඇති බව හා කොවිඩ් වසංගතය හා අනෙකුත් කඩිනම් විමර්ශන හේතුවෙන් පොලිස් විමර්ශනයන්හි ප්‍රමාදයන් පවතින බව. | සභාවට ලැබෙන වැදගත් සියළු පැමිණිලි විමර්ශනය කර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. පොලිසිය වෙත යොමුකර තිබුණු පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව පසු විපරම් සිදුකළ යුතුය. ලැබෙන සියලුම පැමිණිලි පරීක්ෂාව සඳහා යොමු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශයඅ |
|---|---|---|---|
| (අ) | සභාවේ ආයුර්වේද වෛද්‍යවරු, පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු, ආයුර්වේද හෙද නිලධාරීන් හා භෛසජ්ජකවරු ලියාපදිංචි කිරීම, ඔවුන් වෙනුවෙන් විභාග පැවැත්වීම, විභාග ප්‍රතිඵල නිකුත් කිරීම යනාදී වශයෙන් වූ ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි. | කාර්යසාධන දර්ශක පිහිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සැළසුම් කිරීම පිළිබඳව ආයුර්වේද වෛද්‍ය සභාවේ අවධානය යොමු කරන බව. | ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීමට කාර්යසාධන දර්ශක පිහිටුවා සමාලෝචනය කළ යුතුය. |
| (ආ) | පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු වශයෙන් ලියාපදිංචිය අපේක්ෂිත අයදුම්කරුවන් පුහුණු කාලය තුළ ඇගයීම සඳහා සකස් කළ නිර්ණායක පිළිබඳව විවිධ පාර්ශවයන්ගේ අදහස් ලබා ගැනීමට වැඩි කාලයක් ගැනීම හේතුවෙන් ඒවා මෙතෙක් ක්‍රියාත්මක කිරීමට නොහැකිව පැවතුණි. | මේ සඳහා අදාළ නිර්ණායක සකස් කර ඇති බව හා ආයුර්වේද වෛද්‍ය සභා සාමාජිකයින් හා සම්පත් දායකයින්ගේ සහභාගීත්වයෙන් වැඩ මුළුවක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බැවින් ඉන් පසුව අදාළ කරුණු ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | ඇගයීම් කඩිනමින් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලසීමාව තුළදී පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා සභාව මඟින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ වලින් සුදුසුකම් ලද අයදුම්කරුවන් සංඛ්‍යාව 295 ක් වුවද, එම කාලසීමාව තුළදී පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් 367 ක් වෛද්‍ය සභාවේ ලියාපදිංචි කර තිබුණි. | පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ මඟින් අයැදුම්කරුවන් ලියාපදිංචිය සඳහා සුදුසුකම් ලැබුවද ඔවුන් ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි කරනු ලබන්නේ ඒ සඳහා අදාළ ගාස්තු ගෙවීමෙන් පසුව බව. | සම්මුඛ පරීක්ෂණවලින් සුදුසුකම් ලැබීමෙන් පසුව නිසි පරිදි ලියාපදිංචිවීමෙන් තොරව වෛද්‍ය වෘත්තියේ නිරතවීමට නොහැකිවන සේ නීති සම්පාදනය කර ක්‍රියාත්මක කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයුර්වේද වෛද්‍ය සභාව යටතට ගැනෙන කරුණු සම්බන්ධයෙන් ආයුර්වේද වෛද්‍ය සභා සාමාජිකයින් දැනුවත් කොට ඇති බව හා ක්‍රියාත්මක විය යුතු වැඩ සටහන් සකස් කිරීම සඳහා කටයුතු කරන බව. | තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අදාළව ඉලක්ක, දර්ශක හඳුනා ගැනීමට හා ප්‍රගතිය මිණුම් කිරීමට කටයුතු කළ යුතුය. |